විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 09/2015(සංශෝධන III)

මගේ අංක- විවැ/චක්‍රලේඛ/2018
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10
2018.05.04

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තුව ප්‍රධානීන් /ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

**<u>මරණ පාරිතෝෂික අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම.</u>**

මා විසින් නිකුත් කරන ලද 2015.09.14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 09/2015, 2016.02.08 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 9/2015 (සංශෝධනI) හා 2017.11.09 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 9/2015 (සංශෝධනII) යන චක්‍රලේඛයන්හි උපදෙස් වලට අමතර වශයෙනි.

02. මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය මාර්ගගතව (online) සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති අතර මෙම සේවාවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.pensions.gov.lk හි PMS (Pension Management System) ලෙස විශේෂ යොමුව (link) ඔස්සේ සම්බන්ධ විය හැකිය.

03. මෙම සේවාව ප්‍රථම වරට ලබා ගැනීමේදී අදාළ රාජ්‍ය ආයතනය හා භාවිතා කරන නිලධාරීන් ලියාපදිංචි විය යුතු අතර ඉන් අනතුරුව ලබා දෙන මුර පද (password) භාවිතා කර පද්ධතියට ඇතුළු විය හැක. දැනටමත් PMS පද්ධතියෙහි ලියාපදිංචි වී සිටීනම් නැවත ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.

04. ඉහත සේවාවන් සඳහා පිවිසීම සම්බන්ධ සම්පූර්ණ උපදෙස් මාලාව ඇමුණුම් 01 ලෙස මෙම චක්‍රලේඛයට අමුණා ඇත. ඊට අමතරව www.sathkara.pensions.gov.lk/guidlines යන වෙබ් යොමුව (Web link) මගින් ඉහත මෘදුකාංගය භාවිතා කරන ආකාරය ශ්‍රව්‍ය දෘශ්‍ය (video) මාධ්‍යයෙන්ද දැක බලා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

05. මෙම සේවාව 2018.06.01 දින සිට ක්‍රියාත්මක වන අතර එදින සිට පැරණි ක්‍රමවේදය මගින් එවනු ලබන මරණ පාරිතෝෂික අයදුම්පත් (PD05) භාර ගනු නොලැබේ.

06. දත්ත ඇතුලත් කිරීමෙන් පසු ලබාගන්නා අයදුම්පත (Hard copy) පහත සඳහන් ලේඛන සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

මිය ගිය නිලධාරියාගේ,

I. මරණ සහතිකයේ මුල් පිටපත.
II. උප්පැන්න සහතිකයේ මුල් පිටපත.
III. ජාතික හැඳුනුම්පතෙහි සහතික කල පිටපතක්.
IV. චර්යා සටහනෙහි සහතික කල පිටපතක්.
V. අවසන් වරට ලබාගත් වැටුප් වාර්තාවේ සහතික කල පිටපතක්.
VI. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව වැටුප් පරිවර්තන ලිපිය.
VII. සියළුම යැපෙන්නන්ගේ බැංකු ගිණුම් පොත්වල සහතික කල පිටපත්
VIII. දයකයා මිය යන අවස්ථාවේදී ඔහුගෙන් යැපුණු නිත්‍යානුකූල යැපෙන්නන් පිලිබඳ වාර්තාව (ප්‍රාදේශීය ලේකම් සහතික කළ) යැපෙන්නන් රැකියාවක් කරයි නම් රැකියාවේ නිරතවූ දිනය, විවාහක නම් විවාහ වූ දිනය ඇතුලත් කරන්න.
IX. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 6/2015 (1) අනුව සම්පූර්ණ කරන ලද PD4 අකෘති පත්‍රය හා අදාල ලේඛන

07. රාජ්‍ය සේවයේ කාර්යක්ෂම හා ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතය වැඩි දියුණු කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගන්නා ක්‍රියාමාර්ගයන් සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි.

08. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- 1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස
2. අග්‍රාමාත්‍ය ලේකම් - එම
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - එම
4. ලේකම්,රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - එම
5. විගණකාධිපති - එම